# ශ්‍රී ලංකා වරාය අධිකාරිය
# පුරප්පාඩු

මෙහි පහත සඳහන් තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සහිත ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## තනතුර : වරාය ආරක්ෂක නියාමක (පිරිමි)

**(අ) වැටුප :**

වැටුප් කාණ්ඩය : 10:3 (SS 3)
මූලික වැටුප : රු. 35,845/=
වාර්ෂික වේතනාධිකය : රු. 365/=

(දළ වැටුප මාසිකව රු. 111,000/= ක් පමණ වේ.)

**(ආ) යෝග්‍යතාවය :**

දෙවරකට නොවැඩි වාර ගණනකදී භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයයන් හය (06) කින් අ:පො:ස (සා.පෙළ) විභාගය සමත්ව තිබීම.

**(ඇ) අනෙකුත් අනිවාර්යය අවශ්‍යතා :**

i. උස අඩි 05 අඟල් 04 ක් විය යුතුය.
ii. පපුව අඟල් 32 (හුස්ම අල්ලා) තිබිය යුතුය.
iii. මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

**(ඇ) වයස් සීමාව :**

අවුරුදු 18-35 අතර විය යුතුය.
(රාජ්‍ය සේවයේ අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාළ නොවනු ඇත.)

**සටහන :**

i. අ.පො.ස. (උ.පෙළ) සමත් සහ ක්‍රීඩා ජයග්‍රහණ ලබා ඇති අය සහ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ නිපුණතාවයක් ඇති අය කෙරෙහි වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.
ii. තනතුරට බඳවා ගනු ලබන අය ආරක්ෂක සේවයේ වසර දහය (10) ක කාලයක් ඉකුත් වන තෙක් ආරක්ෂක සේවයෙන් බැහැර වෙනත් කිසිදු තනතුරක් සඳහා සළකා බලනු නොලැබේ.
iii. සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාළ සම්මුඛ හා / හෝ ප්‍රායෝගික පරීක්ෂණයෙන් සමත් විය යුතුය.
iv. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ තීරණ අනුව හෝ තනතුරට අදාළ වනුයේ නම් වෛද්‍ය පරීක්ෂණයෙන්ද සමත් විය යුතුය.

**සැලකිය යුතුයි :**

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් දැනටමත් සම්පාදනය කර ඇති හෝ ඉදිරියේදී සම්පාදනය කරනු ලබන සියළුම නීතිරීති වලට අනුකූලව පත්වීම් ලබන්නන් ක්‍රියාකල යුතුය.

තෝරාගත් අපේක්ෂකයින් ශ්‍රී ලංකා වරාය අධිකාරියට අවශ්‍ය පරිදි අධිකාරියේ ඕනෑම අංශයක / කොට්ඨාශයක හෝ දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට බැඳී සිටී.

අයදුම්පත් වයස, අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද පිළිබඳ සහතික වල ඡායා පිටපත් සමඟ "ප්‍රධාන කළමනාකරු (මානව සම්පත් සහ පරිපාලන), මානව සම්පත් සහ පරිපාලන කොට්ඨාශය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, කොච්චිකඩේ, කොළඹ 13" යන ලිපිනයට ලැබෙන සේ 2024.07.12 වන දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. අයදුම්පත බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"වරාය ආරක්ෂක නියාමක (පිරිමි) තනතුර සඳහා"** යනුවෙන් සඳහන් කළ යුතු වේ.

<u>අදාළ සහතික වල ඡායා පිටපත් අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.</u>

රජයේ හෝ රාජ්‍ය සංස්ථාවන්හි සේවයේ නියුතු අපේක්ෂකයින් තම අයදුම්පත් දෙපාර්තමේන්තු/ සංස්ථා ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු අතර, ඉහත තනතුර සඳහා අයදුම්කරු තෝරාගනු ලැබුවහොත් දෙපාර්තමේන්තු/ සංස්ථා සේවයෙන් මුදා හැරීමට එකඟ වන බවට සටහනක් තිබිය යුතුය.

**සභාපති**